# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,355 - 2023 ඔක්තෝබර් මස 20 වැනි සිකුරාදා - 2023.10.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

### තනතුරු - ඇබෑර්තු

**අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය**

නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ ලේකම් තනතුර සඳහා බඳවා ගැනීම - 2023 (සීමිත පදනම)

නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ ලේකම් තනතුර සඳහා පවතින පුරප්පාඩුව සඳහා සුදුස්සෙකු තෝරා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙළ කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර **ලේකම්, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය, අංක 19, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම් පස ඉහළ කෙළවරේ "නීති කොමිෂන් සභා දෙපාර්මේන්තුවේ විධායක සේවා ගණයේ ලේකම් තනතුර සඳහා සීමිත පදනමින් බඳවා ගැනීම" යනුවෙන් පැහැදිලි ව සටහන් කළ යුතු ය. අයදුම්පත් කැඳවන අවසාන දිනය **2023/11/20 දින වේ.**

*සටහන* - ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නො ලැබේ. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි පාඩුව අයදුම්කරුවන් විසින් ම විඳ දරා ගත යුතුය.

01. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :*

අංක අමප/16/0927/755/008 දරන 2016.06.14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබා දෙන ලකුණු මත තෝරා ගනු ලබයි. පත්වීම ක්‍රියාත්මක වන දිනය අමාත්‍ය මණ්ඩලයේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ.

02. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය. ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(ii) නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ I ශ්‍රේණියේ ලේකම් තනතුර සඳහා වන III වන කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත් නොවූ නිලධාරියෙකු නම් තනතුරට පත් වී වසරක් ගත වීමට පෙර III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව භාෂාව පිළිබඳ ප්‍රවීණතා මට්ටම වසර 05ක් තුළ දී ලබා ගත යුතුය. රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරින් විසින් වසර 03ක් තුළ දී එක් රාජ්‍ය භාෂාවක් පිළිබඳව ප්‍රවීණතාවය ලබා ගත යුතු අතර අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය වසර 05ක් ඇතුළත ලබාගත යුතුය.

(iv) අමාත්‍ය මණ්ඩල තීරණවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

03. *වැටුප් පරිමාණය :*
මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 දරන චක්‍රලේඛයට අනුව SL-1-2016, රු. 47,615-10x1335 - 8 x 1630 - 17 x 2170 - රු. 110,895 ක මාසික වැටුප් පරිමාණයක් හිමි වේ. ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් තලය රු. 76,175 ක් වන අතර වැටුප් පියවර 20 වේ.

04. *සුදුසුකම් -*

04.01 අධ්‍යාපන සුදුසුකම් :
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබූ ආයතනයක් විසින් පිරිනමනු ලැබූ නීති ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබිය යුතුය.

04.02 වෘත්තීය සුදුසුකම් :
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 අනුව, රජයේ අමාත්‍යාංශයක/දෙපාර්තමේන්තුවක විධායක ගණයේ තනතුරක සේවය කිරීම සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වීම.

04.03 පළපුරුද්ද :

(අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 අනුව, විධායක සේවා ගණයේ පළමු ශ්‍රේණියේ නිලධාරියෙකු වීම හෝ විධායක සේවා ගණයේ දෙවන ශ්‍රේණියේ වසර 07ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක 07 උපයාගෙන තිබිය යුතුය.

(ආ) පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්විය යුතුය.
(ඇ) පූර්වාසන්න වසර 05ක් තුළ විනයානුකූල දඬුවමකට ලක් නොවී තිබිය යුතුය.

05. වයස් සීමාව :
දැනටමත් රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් අතරින් අයදුම්පත් කැඳවන බැවින් වයස් සීමාව අදාළ නොවේ.

06. කායික සුදුසුකම් :
සෑම අපේක්ෂකයෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙ හි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

07. වෙනත් සුදුසුකම් :

(i) අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
(ii) අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් නිවේදනයේ සඳහන් කරනු ලබන අවසන් දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

08. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

අංක අමප/16/0927/755/008 දරන 2016.06.14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් ලකුණු ලබා දෙනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ම සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

09. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙන ක්‍රමය :

| ලකුණු ලබා දිය යුතු ක්ෂේත්‍ර | මුළු ලකුණු |
|---|---|
| අමතර අධ්‍යාපන සුදුසුකම් | 45 |
| දේශීය විදේශීය පුහුණුවීම් | 20 |
| අයදුම්කරු විසින් ප්‍රකාශනයට පමුණුවා ඇති නීති පර්යේෂණ පිළිබඳ ප්‍රකාශන | 20 |
| අතිරේක පළපුරුද්ද | 10 |
| සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ අභිමතය පරිදි නායකත්වය, පෞරුෂය හා සන්නිවේදන කුසලතා | 05 |
| එකතුව | 100 |

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව ඉහලම ලකුණු ලබාගත් අයදුම්කරු ලේකම් තනතුරට පත් කරනු ලැබේ.

10. අපේක්ෂකයාගේ අනන්‍යතාවය :
යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින් ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතික පත්වල මුල් පිටපත් හා අයදුම්කරුවන් විසින් ම නිසි පරිදි සහතික කරන ලද පිටපතක් ද බැගින් ඉදිරිපත් කළ යුතුය.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය

11. (i) අයදුම්පත්‍රය මේ සමඟ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල විය යුතු අතර, සෙ. මී. 22-29 ප්‍රමාණයේ A 4 කඩදාසිවල සකස් කළ යුතු වේ. අංක 1-11 තෙක් ශීර්ෂ පළමුවන පිටුවට ද, 12 සිට අවසන් වන තෙක් ශීර්ෂ දෙවන පිටුවටද වන ලෙස සකස් කළ යුතුය. ඊට අදාල තොරතුරු තම අත් අකුරින් ම පැහැදිලි ව ඇතුළත් කළ යුතුය. සෑම ආකාරයකින් ම සම්පූර්ණ නොවන, මූලික සුදුසුකම් නොමැති, නියමිත දිනට පසුව ලැබෙන හා ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම් පත්‍රයේ පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය, නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුන හොත් අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප වන බවත්, වැඩිදුරටත් දන්වමි. ඉල්ලුම් පත මේ සමඟ ඇති ආදර්ශ ඉල්ලුම්පතට අනුව සැකසිය යුතු ය. ඉල්ලුම් පත්‍ර ලැබුණ බව දන්වනු නොලැබේ.

සැලකිය යුතු ය.- අ. අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ පිටපතක් නොඇමිණිය යුතු ය.

ආ. ඉල්ලූ අවස්ථාවක දී ලියවිලි හෝ ඒවායේ මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයින්ගේ අයදුම්පත්‍ර ගැන සලකා බලනු නො ලැබේ.

(ii) රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථාවල සේවයේ නියුක්ත නිලධාරින් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මාර්ගයෙන් අයදුම්පත්‍ර එවිය යුතුය.


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2023 නොවැම්බර් මස 10 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 ඔක්තෝබර් මස 27 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත හැක.

12. අමාත්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන නියෝග, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති, කළින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියේ කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වන අතර මෙම බඳවා ගැනීමේ නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කරුණක් සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ.

13. සාවද්‍ය තොරතුරු සැපයීම :

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන්කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එවැනි අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාල ක්‍රියාමාර්ගයන්ට යටත් ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

14. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

වසන්තා පෙරේරා,<br>
ලේකම්,<br>
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා<br>
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කණ අමාත්‍යාංශය.

අංක 19, ශ්‍රී සංඝරාජ මාවත,<br>
කොළඹ 10.<br>
2023 ඔක්තෝබර් මස 06 වැනි දින.

| |
|---|
| අංකය : |
| කාර්යලීය ප්‍රයෝජන සඳහා |

**ආදර්ශ අයදුම්පත**

*අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය*

*නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ ලේකම් තනතුර සඳහා අයදුම් පත්‍රය - සීමිත පදනම*

01. (අ) මුලකුරු සමග නම (සිංහලෙන්/දෙමළෙන්) :—————.<br>
මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.

(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :—————.<br>
සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.

02. ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :—————.

03. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.

04. දුරකථන අංකය :—————.

05. ජාතික හැඳුනුම්පත් අංකය :<br>
06. ස්ත්‍රී/පුරුෂ භාවය :—————.

07. උපන් දිනය : වර්ෂය :—————. මාසය :—————. දිනය :—————.

08. ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :- වර්ෂ :—————. මාස :—————. දින :—————.

09. ජාතිය :—————.

10. විවාහක/අවිවාහක බව :—————.

11. පශ්චාත් උපාධිය පිළිබඳ විස්තර :<br>
විශ්වවිද්‍යාලය :—————.<br>
විෂය ක්ෂේත්‍රය :—————.<br>
උපාධිය පිරිනැමූ දිනය :—————.<br>
භාෂා මාධ්‍ය :—————.

12. නීතිඥයකු ලෙස දිවුරුම් දුන් දිනය :—————.

13. නීතිඥයකු ලෙස පළපුරුද්ද :—————.

14. දැනට දරන තනතුර :—————.<br>
ශ්‍රේණිය :—————.<br>
එම ශ්‍රේණියට පත්වූ දිනය :—————.<br>
වර්තමාන සේවා ස්ථානය :—————.

15. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 04.02 ඡේදයට අනුව වෘත්තීය සුදුසුකම් :

(i) ................................................................................<br>
(ii) ................................................................................<br>
(iii) ................................................................................<br>
(iv) ................................................................................<br>
(v) ................................................................................

16. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 09 ඡේදයට අනුව සුදුසුකම් :-

(i) ................................................................................<br>
(ii) ................................................................................<br>
(iii) ................................................................................<br>
(iv) ................................................................................<br>
(v) ................................................................................

17. භාෂා ප්‍රවීණතාවය (අදාළ තීරුවේ ✓ ලකුණ යොදන්න)

| | ඉතා හොඳයි | හොඳයි | සාමාන්‍යයි | දුර්වලයි |
|---|---|---|---|---|
| සිංහල | | | | |
| දෙමළ | | | | |
| ඉංග්‍රීසි | | | | |

අයදුම්කරුගේ සහතිකය

................. වන මම මෙහි සඳහන් කරන ලද සියලුම කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මම රාජ්‍ය සේවයෙන් පහකර හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාවය මත සේවයෙන් විශ්‍රාම ගන්වා හෝ නොමැති බවත්, තනතුරු අතහැර ගිය අයෙකු සේ සලකා නැති බවත් සහතික කරමි. මෙහි සඳහන් කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව මා තෝරා ගැනීමට කලින් හෙළිවුවහොත් නුසුදුසු කිරීමට යටත් වන බවත්, තෝරා ගැනීමෙන් අනතුරුව එවැනි තත්ත්වයක් අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා රැකියාවෙන් ඉවත් කළ හැකි බව මම දනිමි.

—————,<br>
අයදුම්කරුගේ අත්සන

දිනය :—————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය (සෑම අයදුම්කරුවෙකු ම සිය අයදුම්පත දෙපාර්තමේන්තු ප්‍රධනියා මගින් ඉදිරිපත් කළ යුතුය)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන .................................. මයා/මිය/මෙනෙවිය අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ................. තනතුරක සේවය කරන බවද වරදකට අවවාද කිරීම් හැර කිසිම ආකාරයක විනයානුකූල දඬුවමකට ඔහු/ඇය භාජනය වී නොමැති බව ද, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවද දන්වමි.

—————,<br>
අමාත්‍යාංශ ලේකම්ගේ/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ<br>
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :—————.<br>
නම :—————.<br>
තනතුර :—————.<br>
අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :—————.

10-302

# විභාග, විභාග, ප්‍රතිඵල ආදිය

**ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය**<br>
(2022 අංක 105 දරන පාර්ලිමේන්තු පනත් කෙටුම්පත හරහා සංස්ථාපනය කිරීමට කටයුතු යොද ඇත.)

ව්‍යාපාර සැලසුම්කරණය සහ කම්කරු නීතිය පිළිබඳ විධායක ඩිප්ලෝමා පාඨමාලාව - 2023/2024

ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනයේ ව්‍යාපාර සැලසුම්කරණය සහ කම්කරු නීතිය පිළිබඳ විධායක ඩිප්ලෝමාව විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් උසස්පෙළ අවසන් කළ සිසුන්/වානිජ අංශයෙන් අධ්‍යාපනයේ නිරත සිසුන්/රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ රැකියා නියුතු පිරිස්, ව්‍යාපාරයක් ඇරඹීමට සිටින හෝ විදේශගත වී සිටින / විදේශගතවීමට බලාපොරොත්තුවෙන් සිටින හෝ ව්‍යාපාර කළමනාකරණය, සැලසුම්කරණය සහ කම්කරු නීති පිළිබඳව උනන්දුවක් දක්වන පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයට අයදුම් කල හැක.

| | | |
|---|---|---|
| සුදුසුකම් | : | අ.පො.ස (උසස් පෙළ) ඕනෑම විෂය ධාරාවකින් ලබාගත් S සාමාර්ථ 3ක් සහිතව සමත් වීම.<br>හෝ<br>වෘත්තීය සහ අධ්‍යාපනික වශයෙන් සලකා බැලිය හැකි වෙනත් සුදුසුකම් සපුරා තිබීම. |
| සම්පූර්ණ අර්ඝ (**Total credit**) | : | 30කි. |
| සාමාසික ගණන | : | සාමාසික 02 කි. |
| ඩිප්ලෝමාවේ ස්වභාවය | : | මාර්ගගත ඉගැන්වීම් ක්‍රමවේදය (විවෘත සහ දුරස්ථ අධ්‍යයනය) |
| ඉගැන්වීම් ක්‍රමවේදය | : | **LMS** පද්ධතිය හරහා ඉගැන්වීම්. පහසු දිනයක් තුළ දී නැරඹිය හැකි පටිගත කරන ලද දේශන සහ නිබන්ධන ලබාදීම සිදුකෙරේ. |
| මාධ්‍ය | : | සිංහල හෝ ඉංග්‍රීසි |
| පාඨමාලා කාලය | : | මාස 12 කි. |
| පාඨමාලා ගාස්තු සහ ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු | : | සම්පූර්ණ ඩිප්ලෝමාව සඳහා අයකිරීම රු. 37,000.00 කි. ඩිප්ලෝමාව සඳහා ලියාපදිංචි වීමේ දී රු. 1000.00ක මුදලක් ලියාපදිංචි ගාස්තුව වශයෙන් ගෙවිය යුතුය. රු 36,000.00 ක මුදල එකවර හෝ වාරික 10කින් ගෙවා අවසන් කළ හැකි වේ. |

**පාඨමාලාව සඳහා අයදුම් කළයුතු ආකාරය :**

අයදුම්කරු විසින්,

1. තම ජාතික හැඳුනුම්පතේ ඉදිරි සහ පසුපිට ඡායාරූපයක්
2. අ.පො.ස. (උසස් පෙළ) විභාග ප්‍රතිඵල ලේඛනයේ හෝ වෙනත් අධ්‍යාපනික සහතික ඡායාරූප,
3. අයදුම්කරුගේ වර්ණවත් පැහැදිලි ඡායාරූපය.

**0740437777 (WhatsApp)** අංකයට යොමු කළ යුතු ය.

**පාඨමාලාව සඳහා ශිෂ්‍යයින් බඳවාගන්නා අවසාන දිනය : 2023/11/25 වේ.**

වැඩි විස්තර සඳහා : කාර්යාල වේලාවන් වන පෙ.ව. 8.30 සිට ප.ව. 4.30 දක්වා, 081 3169800 දුරකථන අංකය හරහා විමසිය හැකිය.

ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරි,<br>
ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය.

---

**මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය**

ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කරගැනීම - 2023/2024

මොරටුව විශ්වවිද්‍යාලයට අයත් තාක්ෂණික ආයතනය මගින් පවත්වනු ලබන තුන් අවුරුදු පූර්ණ කාලීන ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම පිණිස සුදුසුකම්ලත් අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම පාඨමාලාව, දියගම, හෝමාගම පිහිටි මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය තුළ පැවැත්වෙනු ඇත.

1. **සාමාන්‍ය :**

ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව දෑ අවුරුදු අධ්‍යයන හා එක් අවුරුදු ප්‍රායෝගික යන්ත්‍රාගාර පුහුණුවකින් ද සමන්විත වේ. පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ. මෙම පාඨමාලාවේ දී පහත සඳහන් විෂයය ක්ෂේත්‍රයන් හැදෑරීමට අවස්ථාව ලැබේ.

(අ) නාවුක අධ්‍යයන ක්ෂේත්‍ර කාණ්ඩය (Set 1)

i. නාවුක ඉංජිනේරු තාක්ෂණය<br>
ii. නෞකා චලන අධ්‍යයනය හා තාක්ෂණය

(ආ) අනෙකුත් අධ්‍යයන ක්ෂේත්‍රයන් (Set 2)

i. රසායන ඉංජිනේරු තාක්ෂණය<br>
ii. සිවිල් ඉංජිනේරු තාක්ෂණය<br>
iii. විදුලි ඉංජිනේරු තාක්ෂණය<br>
iv. ඉලෙක්ට්‍රොනික් හා විදුලි සංදේශ ඉංජිනේරු තාක්ෂණය<br>
v. තොරතුරු තාක්ෂණය<br>
vi. යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය<br>
vii. පොලිමර් තාක්ෂණය<br>
viii. පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණය

2. **යෝග්‍යතාවය**

2.1 **වයස :**

(අ) **2022.12.31** වැනි දිනට අයදුම්කරුගේ වයස අවුරුදු 24ට වැඩි නොවිය යුතුය.

(ආ) නෞකා චලන අධ්‍යයන තාක්ෂණය හා නාවුක ඉංජිනේරු තාක්ෂණය යන පාඨමාලාවන් හැදෑරීමට අපේක්ෂකයන් තෝරා ගැනීමේ දී **2022.12.31 වැනි** දිනට වයස අවුරුදු 20 ට අඩු අයදුම්කරුවන්ට ප්‍රමුඛත්වය දෙනු ලැබේ. එම පාඨමාලාව සඳහා සිසුන් තෝරා ගැනීමේ දී විශේෂ වෛද්‍ය පරීක්ෂණයකට හා සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිට ඉන් සමත් විය යුතු වේ.

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති ඕනෑම විශ්වවිද්‍යාලයක (විවෘත විශ්වවිද්‍යාල හැර) හෝ උසස් අධ්‍යාපන ආයතනයක පූර්ණකාලීනව ලියාපදිංචි වී ඇති සිසුන් හා වෙනත් පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයක පූර්ණකාලීනව ලියාපදිංචි වී ඇති සිසුන් මෙම පාඨමාලාව සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

2.2 **අධ්‍යාපන සුදුසුකම්**

(අ) අයදුම්කරුවන් ශ්‍රී ලංකා විභාග කොමසාරිස් ජනරාල් විසින් 2020, 2021, හෝ 2022 වසරේ පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ.) විභාගයේ දී එකවර පහත සඳහන් විෂයයන්ගෙන් 03 ක් සමත්විය යුතුය.

i. භෞතික විද්‍යාව
ii. රසායන විද්‍යාව
iii. සංයුක්ත ගණිතය
iv. උසස් ගණිතය

(ආ) ''නෞකා චලන අධ්‍යයන තාක්ෂණය'' හා ''නාවුක ඉංජිනේරු තාක්ෂණය'' යන පාඨමාලාවන් සඳහා අයදුම් කිරීමට අපේක්ෂිත අයදුම්කරුවන් හට අ.පො.ස. (සා. පෙළ) විභාගයේ ඉංග්‍රීසි විෂයය සඳහා සම්මාන (C) සාමාර්ථයක් තිබීම අනිවාර්ය වේ.

3. **තෝරා ගැනීමේ පදනම/ක්‍රියා පරිපාටිය**

3.1 පාඨමාලාවට ඇතුළත් කර ගැනීම :

ශිෂ්‍යයන් තෝරා ගැනීම අ.පො.ස. (උ. පෙළ) විභාගයේ ප්‍රතිඵල හා මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනය මගින් පැවැත්වෙන යෝග්‍යතා පරීක්ෂණයේ සමාර්ථය මත සිදුවේ.

යෝග්‍යතා පරීක්ෂණය සමත් වූ ශිෂ්‍යයන් අතරින් අ.පො.ස. (උ. පෙළ) විභාග ලකුණුවල කුසලතාව මත (Z ලකුණු මත) සිසුන් තෝරා ගනු ලැබේ. 40% ක් අ.පො.ස. (උ. පෙළ) විභාගයේ කුසලතාව මත හා 60% ක් දිස්ත්‍රික් පදනම මත ශිෂ්‍යයන් තෝරා ගැනීම සිදුවේ.

3.2 අධ්‍යයන ක්ෂේත්‍රය :
යෝග්‍යතා පරීක්ෂණයේ ලකුණු හා අයදුම්කරුගේ එක් එක් ක්ෂේත්‍රය සඳහා දක්වන කැමැත්තේ අනුපිළිවෙල අධ්‍යයන ක්ෂේත්‍රය තෝරා ගැනීමේ දී සැළකිල්ලට භාජනය කරනු ලැබේ.

4. අයදුම් කිරීමේ පිළිවෙළ :

4.1 අයදුම්පත් පෝරම :

i. පහත සඳහන් අන්තර්ජාල වෙබ් අඩවියෙ හි සඳහන් කර ඇති මාර්ගගත අයදුම්පත්‍රය (online application) හරහා අයදුම්කරුවන් පළමුව සිය අයදුම්පත මාර්ගගතව ඉදිරිපත් කළ යුතුය.
http//www.itum.mrt.ac.lk
ii. මාර්ගගත අයදුම්පත්‍රය (online application) ඉදිරිපත් කිරීමෙන් පසු අයදුම්කරුවන් ස්වයංක්‍රීයව ජනනය වන මාර්ගගත අයදුම්පත්‍රයේ මුද්‍රිත පිටපත භාගත කර ගත යුතුය.
iii. භාගත කළ මුද්‍රිත පිටපතේ අන්තර්ගතය අයදුම්පතෙ හි දක්වා ඇති පරිදි සහතික කළ යුතු වේ. (අයදුම්පතෙ හි 03 සහ 05 යන ඡේද බලන්න)
iv. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පතෙ හි මුද්‍රිත පිටපත බහාලන ලියුම් කවරයේ ඉහළ වම් පස කෙළවරේ ''ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව සඳහා ඇතුළත් වීම- 2023/2024'' යනුවෙන් සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.
v. මාර්ගගත අයදුම්පත්‍රය (online application) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර යොමු කළයුතු අතරම අයදුම්පතෙ හි මුද්‍රිත පිටපත ''සහකාර ලේඛකාධිකාරි, අධ්‍යයන හා ශිෂ්‍ය කටයුතු අංශය, මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය, දියගම, හෝමාගම'' යන ලිපිනයට අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර එවිය යුතුය.
vi. නම ලිපිනය ලියන ලද රු. 110 ක් වටිනා මුද්දර අලවන ලද 9" x 4" ප්‍රමාණයේ ලියුම් කවරයක් ද අයදුම්පත සමග එවිය යුතුය.

*වැදගත් :*

සෑම අයදුම්කරුවෙකු ම නියමිත දිනට පෙර මාර්ගගත අයදුම්පත්‍රය (online application) සහ එම අයදුම්පතෙ හි මුද්‍රිත පිටපත යන දෙක ම ඉදිරිපත් කළ යුතු වේ. මාර්ගගත අයදුම්පත්‍රය (online application) සහ අයදුම්පතෙ හි මුද්‍රිත පිටපත ඉදිරිපත් කිරීමට අපොහොසත් වූ අයදුම්කරුවන්ගේ අයදුම්පත් වැඩිදුර කටයුතු සඳහා සලකා බලනු නොලබන අතර අසම්පූර්ණ අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4.2 **අධ්‍යයන ක්ෂේත්‍රය තෝරා ගැනීම**

i. මෙම පාඨමාලාව අධ්‍යයන ක්ෂේත්‍ර කාණ්ඩ දෙකකින් සමන්විත වේ.
ii. නාවික අධ්‍යයන ක්ෂේත්‍ර කාණ්ඩය (SET 1) හෝ අනෙකුත් අධ්‍යයන ක්ෂේත්‍ර කාණ්ඩය (SET 2) හෝ ක්ෂේත්‍ර කාණ්ඩයන් දෙකම සඳහා ඉල්ලුම් කළ හැක. ක්ෂේත්‍ර කාණ්ඩයන් දෙකම සඳහා අයදුම් කරන්නේ නම් ප්‍රමුඛතාව සඳහන් කළ යුතුය.
iii. නාවික අධ්‍යයන ක්ෂේත්‍ර කාණ්ඩයේ දී එනම් නාවුක ඉංජිනේරු තාක්ෂණය හා නෞකා චලන අධ්‍යයන තාක්ෂණය (SET 1) සඳහා ප්‍රමුඛතාව සඳහන් කිරීමේ දී වඩාත් කැමති ක්ෂේත්‍රය 01 ලෙස ද අනෙක් ක්ෂේත්‍රය 02 ලෙස ද සඳහන් කළ යුතුය.
iv. අනිකුත් ක්ෂේත්‍ර කාණ්ඩය (SET 2) සඳහා ප්‍රමුඛත්වය 1, 2, 3, 4, 5, 6, 7, 8 සඳහන් කළයුතු අතර වඩාත් කැමති ක්ෂේත්‍රය 01 ලෙස ද ඊළඟ ක්ෂේත්‍රය 02 ලෙස ද අන්තිම ක්ෂේත්‍රය 08 ලෙස ද සඳහන් කළ යුතුය.

5.

i. ඉල්ලුම්පත් ගාස්තු :

ඉල්ලුම්පත් ගාස්තු වශයෙන් එක් ක්ෂේත්‍ර කාණ්ඩයක් සඳහා රු. 1000.00 (රුපියල් දහසක්) හෝ ක්ෂේත්‍ර කාණ්ඩයන් දෙකම සඳහා නම් රු. 1,200.00 (රුපියල් එක්දහස් දෙසීයක්) ගෙවිය යුතු අතර, එම ගෙවීම ''මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය - ලංකා බැංකුවේ හෝමාගම ශාඛාවේ ගිණුම් අංක 83062337'' දරන ගිණුමට බැර වන සේ ගෙවිය යුතුය. මෙම අයදුම්පත් ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

ii. මුදල් ගෙවූ රිසිට්පතෙ හි ස්කෑන් (Scan) කළ පිටපතක් මාර්ගගත අයදුම්පත්‍රය (online application) සමග යොමු කළයුතු අතර රිසිට්පතෙ හි මුල් පිටපත සමග අයදුම්පතෙහි මුද්‍රිත පිටපත එවිය යුතුය.

iii. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය **2023.11.20** දින වේ.

6. යෝග්‍යතා පරීක්ෂණය හා ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතා පරීක්ෂණය :

අයදුම්කරුවන් විසින් අ.පො.ස. (උ. පෙළ) විභාගයේ ලබාගත් ප්‍රතිඵල, කුසලතා පදනම මත හා එක් එක් දිස්ත්‍රික්කයට අදාළ ලසු කළ සිසුන් ප්‍රමාණය මත, මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණය හා ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

7. පාඨමාලාව සඳහා ලියාපදිංචි කිරීම :

i. යම් පාඨමාලාවක් සඳහා තෝරා ගන්නා ලද අපේක්ෂකයන්, පාඨමාලාව සඳහා ලියාපදිංචි කරනු ලබන දින, පහත සඳහන් සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය. :

- අ.පො.ස. (උ. පෙළ) සහතිකය
- අ.පො.ස. (උ. පෙළ) Z ලකුණු සඳහන් සහතිකය
- පාසැල් හැරයාමේ සහතිකය
- උප්පැන්න සහතිකය
- සහතිකපත්වල හා අදාළ ලියකියවිලිවල නමෙහි යම් වෙනස්කම් ඇත්නම් ඒ සඳහා දිවුරුම් ප්‍රකාශයක්

8. **ඉතා වැදගත්**

i. ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා ලියාපදිංචි වන කිසිම අපේක්ෂකයෙකු, එම පාඨමාලාවේ කාලසීමාව තුළදී, මෙම විශ්වවිද්‍යාලයේ වෙනත් පාඨමාලාවක් හෝ ශ්‍රී ලංකාවේ පිහිටා ඇති අන් කිසිම විශ්වවිද්‍යාලක පාඨමාලාවක් (විවෘත විශ්වවිද්‍යාල හැර) හෝ වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක පාඨමාලාවක් හැදෑරීමට සුදුසුකම් නොලබයි.

ii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති කිසිම විශ්වවිද්‍යාලයක (විවෘත විශ්වවිද්‍යාලය හැර) හෝ උසස් අධ්‍යාපන ආයතනයක පූර්ණකාලීනව ලියාපදිංචි වී ඇති සිසුන් ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

iii. අයදුම්පතෙහි සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි විය යුතු අතර යම් ලෙසකින් තොරතුරු අසත්‍ය බව හෙළිවුවහොත් අයදුම්කරු ඕනෑම අවස්ථාවක පාඨමාලාවෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

අධ්‍යක්ෂ,
මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය.

10-279

---

**ජනමාධ්‍ය අමාත්‍යාංශය**

**රැකියා සුලභ මුද්‍රණ සහ ග්‍රැෆික්ස් ක්ෂේත්‍රයට පිවිසෙන්න**

**ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය**

ISO තත්ත්ව සහතිකයෙන් පිදුම්ලත් ආයතනයකි

**ග්‍රැෆික්ස්, මල්ටිමීඩියා සහ මුද්‍රණ පාඨමාලා - 2023 වර්ෂය**

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා හදාරා මුද්‍රණ, ග්‍රැෆික්ස් සහ මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ නිපුණයෙකු වන්න.

**පාසල් හැරගිය සිසුන් සඳහා ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණකරණය පිළිබඳ පූර්ණකාලීන NVQ පාඨමාලාව**
**NVQ Training Programme in Offset Lithopress Operation for School Leaves (Full time)**

අද දිවයිනේ ඉහළ රැකියා ඉල්ලුමක්ව පවතින ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ පූර්ණකාලීන පාඨමාලාවක් වන මෙම පුහුණු වැඩසටහන තුළින් ඕෆ්සෙට් ලිතෝකරණය (Offset Lithography) Sheet Fed සහ Stream Feeder ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරවීම ඇතුළු ඕෆ්සෙට් මුද්‍රණකරණයට අදාළ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම හා පුහුණුව ලබාදේ. පුහුණුව අවසාන කිරීමෙන් පසු ඔවුන් රැකියා සඳහා අනුයුක්ත කෙරේ.

පාඨමාලා කාලය : මාස 14 යි (පූර්ණකාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 26,000

---

**මයික්‍රොසොෆ්ට් ඔෆීස් - Microsoft Office**

මෙම පාඨමාලාව තුළින් MS Office පිළිබඳ පූර්ණ අවබෝධයක් සහ පුහුණුවක් ලබා දෙන අතර, පරිගණක භාවිතය පිළිබඳව ද මූලික දැනුම හා අවබෝධය ද ලබා දේ. මෙම පාඨමාලාව පාසල් හැරගිය නවකයන්ට මෙන්ම ආයතනවල රැකියාවන්හි නියුතු පුද්ගලයන්ට ද MS Office පිළිබඳව පූර්ණ දැනුම හා අවබෝධය ලබා දේ.

පාඨමාලා කාලය : මාස 05 යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 16,000

---

**පරිගණක ආශ්‍රිත ග්‍රැෆික් නිර්මාණකරණය - Computer Graphic Design**

ග්‍රැෆික්, මුද්‍රණ හා මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන ලෙස මෙම පාඨමාලාව සකස් කර ඇති අතර, ඒ තුළින් අද ග්‍රැෆික් නිර්මාණයට අවශ්‍ය සියලු මෘදුකාංග පිළිබඳ පුළුල් පුහුණුවක් ලබා දෙයි. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට හා ග්‍රැෆික් ක්ෂේත්‍රයේ නියැළෙන පුද්ගලයන්ට මනා දැනුම ද, පුහුණුව ද ලබා දේ.

පාඨමාලා කාලය : මාස 06 (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි

පාඨමාලා ගාස්තුව : ආයතනික සහතිකපත් පාඨමාලාව රු. 23,000 NVQ සහතිකපත් පාඨමාලාව රු. 36,000

---

**පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම සහ පිටු සැකසීම - Computer Typesetting and Desktop Publishing**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර මුද්‍රණ, ග්‍රැෆික්ස්, ප්‍රචාරක හා ප්‍රකාශන ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන පාඨමාලා අන්තර්ගතයකින් සකස්වන අතර ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත් වීමට බලාපොරොත්තුවන නවකයින් සඳහා විශේෂයෙන් සැකසුණු පාඨමාලාවකි.

පාඨමාලා කාලය : මාස 06 යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 16,000

---

**වෙබ් අඩවි නිර්මාණය - Web Designing**

මෙම පාඨමාලාව තුළින් වෙබ් අඩවි නිර්මාණය පිළිබඳ නවීන තාක්ෂණයට අනුකූලව පුළුල් අවබෝධයක් සහ පුහුණුවක් ලබා දේ. පරිගණක ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට හා මෙම ක්ෂේත්‍රයට ඇතුළත් වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

පාඨමාලා කාලය : මාස 05 යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 21,000

---

**පොත් බැඳීම හා නිමාකරණය - Book Binding & Finishing**
**පොත් බැඳීම - Book Binding - NVQ 4**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් ඇත. මේ තුළින් පොත් බැඳීම, නිමාව පිළිබඳ පුළුල් අවබෝධයක්, න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව මේ තුළින් ලබාදේ. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට මෙන්ම ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට ද මහත් ප්‍රයෝජනයකි.

පාඨමාලා කාලය : මාස 06 - මාස 08 මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 36,000
NVQ පාඨමාලාව : රු. 65,000

---

**අරේඛීය සංස්කරණය - Non Linear Editing**

මෙම පාඨමාලාව තුළින් රූපවාහිනී වැඩසටහන් සංස්කරණය සහ පිටපත් රචනය පිළිබඳ පූර්ණ ප්‍රායෝගික සහ න්‍යායාත්මක අවබෝධය ලබාදේ. පාසල් හැරගිය සිසුන්ට ද වීඩියෝ, රූපවාහිනී, චලන රූප කර්මාන්තයේ සහ ඉලෙක්ට්‍රොනික් සන්නිවේදන හා චිත්‍රපට කර්මාන්තයේ නිරතවූවන් හට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

පාඨමාලා කාලය : මාස 06 (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 30,000

---

**ත්‍රිමාණ සජීවීකරණය - Digital Animation**

මෙම පාඨමාලාව තුළින් පරිගණක ආධාරයෙන් ද්විමාන සහ ත්‍රිමාණ චලන රූප නිර්මාණකරණය කිරීම සහ එම රූප, රූපවාහිනී සහ චිත්‍රපට මාධ්‍ය සඳහා යොදා ගන්නා අයුරු සවිස්තරාත්මකව පුහුණු කෙරේ.

පාඨමාලා කාලය : මාස 06 (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 30,000

---

**පරිගණක දෘඪාංග එකලස් කිරීම සහ සැකසීම - Computer Hardware & PC Assembly**

මෙම පාඨමාලාව තුළින් පරිගණක දෘඪාංග/මෘදුකාංග සහ පරිගණක එකලස් කිරීම පිළිබඳව මනා දැනුමක් සහ අවබෝධයක් ලබා දෙන අතර, එදිනෙදා පැන නගින දෘඪාංග/මෘදුකාංගවලට අදාළ තාක්ෂණික හා ප්‍රායෝගික ගැටළු විසඳා ගැනීමට මහත් සේ මෙම පාඨමාලාව ප්‍රයෝජනවත් වේ. නවකයන්ට මෙන් ම පරිගණක තාක්ෂණයේ නියැළි පුද්ගලයන්ට ද මෙම පාඨමාලාව එකසේ ප්‍රයෝජනවත් වනු ඇත.

පාඨමාලා කාලය : මාස 04 යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු.21,000

**ඕෆ්සෙට් ලිතෝකරණය - Offset Lithography**

මෙම පාඨමාලාව තුළින් අද ප්‍රචලිතව පවතින ඕෆ්සෙට් මුද්‍රණ තාක්ෂණය සහ ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳව පූර්ණ අවබෝධයක් සහ දැනුමක් ලබා දේ. ඕෆ්සෙට් මුද්‍රණ ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට මෙන් ම එම ක්ෂේත්‍රයට ඇතුළත්වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව මහත් ප්‍රයෝජනවත් වේ.

පාඨමාලා කාලය : වසර 01 යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 27,000

**නවීන වර්ණ 4 මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව**
**Modern Four Colour Offset Printing Machine Operation**

මෙම පාඨමාලාවේ අරමුණ වනුයේ නවීනතම සිව් වර්ණ ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර පිළිබඳ පුළුල් වපසරියක පුහුණුවක් ලබා දී ඒ තුළින් යන්ත්‍ර ස්වාධීනව ක්‍රියාකරවීමට සහ තත්ත්වයෙන් උසස් ගුණාත්මක ප්‍රතිඵල ලබාගැනීම සඳහා සහභාගිවන්නවුන් පුහුණු කිරීමය. සියලුම පුහුණුකරුවන්ට නවීනතම 2018 වර්ෂයේ නිෂ්පාදිත Heidelberg Speed Master Offset මුද්‍රණ යන්ත්‍රයක පුහුණුව ලබා දේ. විදෙස්ගත රැකියා සඳහා යොමුවන මුද්‍රණකරුවන්ට මෙම පාඨමාලාව මහත් ඵලදායී පුහුණුවකි.

පාඨමාලා කාලය : මාස 03යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 31,000

**ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - Certificate Course on Digital Printing Technology**

මෙම පාඨමාලාවේ පරමාර්ථය වනුයේ නවීනතම මුද්‍රණ තාක්ෂණය වන ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ පූර්ණ න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුම ලබා දී ඒ තුළින් එම ක්ෂේත්‍රයට පිවිසීමට අවශ්‍ය පුළුල් තාක්ෂණික/ප්‍රායෝගික පුහුණුව සහ අවබෝධය ලබා දීමය.

පාඨමාලා කාලය : මාස 04 යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 21,000

**ග්‍රැෆික් ඩිසයින් පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - Diploma in Graphic Design**

මෙම පාඨමාලාව මගින් ග්‍රැෆික් නිර්මාණකරණය, කළමනාකරණය සහ මෘදුකාංග ඇතුළුව නිර්මාණ සංකල්ප සහ යෙදීම් පිළිබඳ උසස් මට්ටමේ ප්‍රායෝගික සහ න්‍යායාත්මක පුහුණුවක් ලබා දේ. ග්‍රැෆික්ස් නිර්මාණකරණයට අදාළ මෘදුකාංග භාවිතයෙන් සාර්ථක නිර්මාණ බිහි කිරීමේ නිපුණතාවයන් වර්ධනය වන අයුරින් මෙහි විෂය මාලාව සකස්කර ඇති අතර, මෙම පාඨමාලාව හැදෑරීමෙන් ඔබට පරිපූර්ණ ග්‍රැෆික්ස් නිර්මාණකරුවෙකු විය හැක.

කාලය : වසර 01යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 61,000

**වෙබ් අඩවි නිර්මාණය - Certificate Course in Web Design**

මෙම පාඨමාලාව තුළින් වෙබ් අඩවි නිර්මාණකරණය පිළිබඳ නවීන තාක්‍ෂණයට අනුකූලව වෙබ් අඩවියක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය පුළුල් දැනුමක් සහ ප්‍රායෝගික පුහුණුවක් ලබා දේ. මෙම පාඨමාලාව නවකයන්ට ද මාධ්‍ය ක්ෂේත්‍රයේ සේවය කරන සියලු දෙනාටම ඉමහත් ප්‍රයෝජනවත් පාඨමාලාවකි.

පාඨමාලා කාලය : මාස 05 මාධ්‍ය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 21,000

**ඩිජිටල් පෙර මුද්‍රණය - Certificate Course in Digital Pre Press**

මෙම පාඨමාලාව තුළින් පෙර මුද්‍රණ තාක්‍ෂණයට අදාළ මෘදුකාංග සහ අනෙකුත් මුද්‍රණ තාක්‍ෂණයට අදාළ ඩිජිටල් ක්‍රියාවලියන් පිළිබඳ පූර්ණ අවබෝධයක් සහ ප්‍රායෝගික පුහුණුවක් ලබා දේ.

පාඨමාලා කාලය : වසර 01යි මාධ්‍ය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 26,000

**පිරිවැය හා ඇස්තමේන්තුකරණය - Certificate Course in Costing & Estimating**

මෙම පාඨමාලාව තුළින් මුද්‍රණ ක්ෂේත්‍රයේ පිරිවැයකරණය සමග ඇස්තමේන්තුකරණය පිළිබඳ පූර්ණ දැනුමක් සහ අවබෝධයක් ලබාදේ. මුද්‍රණ ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයන්ට ද එම ක්ෂේත්‍රයට ඇතුළත් වන නවකයන්ට ද ඉමහත් ප්‍රයෝජනවත් පාඨමාලාවකි.

පාඨමාලා කාලය : වසර 01 යි මාධ්‍ය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 26,000

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා සියල්ල උසස් ප්‍රමිතියකට අනුව ක්ෂේත්‍රයේ රැකියාවලට ගැළපෙන අයුරින් සකස්කොට ඇති අතර, පාඨමාලා සාර්ථකව නිමකරන සිසුන්හට රජය හා ජාත්‍යන්තරව පිළිගත් වටිනා සහතික පත්‍රයක් ප්‍රදානය කෙරේ.

**පාඨමාලා අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,**
**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08.**

**දුරකතන : 011 2686162, 011 2679791, 071 9716655, 077 7706995**
**ෆැක්ස් : 011 2686162**
**ඊ-මේල් : sliopdir@sltnet.lk**
**වෙබ් අඩවිය : www.sliop.edu.lk**

**ශාඛා : ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය, මාතලේ ශාඛාව,**
**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය.**
**දුරකතන අංක : 066 2222172, 071 0554298.**

10-000

# I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

## බඩු බාහිරාදිය විකිණීම්

**මහෙස්ත්‍රාත් අධිකරණය - නාඋල**

නාඋල මහෙස්ත්‍රාත් අධිකරණය මගින් රාජසන්තක කරනු ලැබූ භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම.

01. නාඋල මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරනු ලැබූ භාණ්ඩ **2023.10.29 වැනි දින පෙ.ව. 09.30** ට එම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

